# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2493/68 – 2026 ජුනි මස 19 වැනි සිකුරාදා – 2026.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 534 A ගල්පාලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෝට්ලොප් වත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක NU/NWE/2024/222 හා 2025.05.02 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – කෝට්ලොප් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2990**

උතුරට : හදුන්කුට්ටිහෙට්ටිගේ දොන් බර්නාඩ් ඇලෝසියස් කුරුකුලාදිත්‍ය හිමිකම් කියන ඉඩම සහ කෝට්ලෝප් වත්ත; නැගෙනහිරට: කෝට්ලෝප් වත්ත සහ සෙල්වරාජ් සහ තවත් අය හිමිකම් කියන ඉඩම; දකුණට: සෙල්වරාජ් සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ හදුන්කුට්ටිහෙට්ටිගේ දොන් බර්නාඩ් ඇලෝසියස් කුරුකුලාදිත්‍ය හිමිකම් කියන ඉඩම; බටහිරට: හදුන්කුට්ටිහෙට්ටිගේ දොන් බර්නාඩ් ඇලෝසියස් කුරුකුලාදිත්‍ය හිමිකම් කියන ඉඩම.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/17/2024/D/15.
2026 මාර්තු මස 05 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 06 – 0244